# ගොවි සෙතට මං පෙත තනිවද? එක්වද?

ශ්‍රී ලංකාවේ ගොවි කටයුතු ක්ෂේත්‍රයෙහි නව අංගයක් වන කුඩා පරිමාණයේ ගොවි සංවිධාන ක්‍රමය කුරුණෑගල ගල්ගමුව ප්‍රදේශය තුළ දැන් ක්‍රියාත්මක කෙරෙයි. කෘෂිකාර්මික සංවර්ධනය අදාළ සැලසුම් සැකැස්ම මෙන්ම සැලසුම් පණ ගැන්වීමද පහළම මට්ටමේ සිට පටන් ගැනිම වඩාත් යෝග්‍ය බව දැන් පැහැදිලිව පෙනී ගොස් ඇති කරුණකි. එම ක්‍රියාවලිය සඳහා ගොවීන්ගේ සාමුහික සංවිධාන මගින් සලසා ගත හැකි සෙත සුළුපටු නොවේ.



ගල්ගමුව ගොවි ජන සේවා මධ්‍යස්ථානයේ පැවැති කුඩා පරිමාණයේ ගොවි සංවිධාන සාකච්ඡාවකට සහභාගි වූ විදනේවරුන් ඇතුලු පිරිසකි.

## ගල්ගමුවේ අත්හදා බැලීම

ශ්‍රී ලංකාවේ ගොවි කටයුතු ක්ෂේත්‍රයේ අළුත්ම අත්හදා බැලීමකි, කුඩා පරිමාණයේ ගොවි සංවිධාන ක්‍රමය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන ලද කුඩා පරිමාණයේ ගොවි සංවිධාන නියමු ව්‍යාපෘතිය පටන් ගන්නා ලද්දේ 1980 මැයි මාස යේ දී ය. ග්‍රාමීය මට්ටමේ ගොවි නායකයන් යටතේ සමූහ වශයෙන් සංවිධානය වී පොදු අරමුණු මත ඇති කර ගත් සැලසුම් අනුව

ක්‍රියා කළ හොත් නිෂ්පාදනය මෙන් ම ගොවි ජනතාවගේ ජීවන තත්ත්වයද ඉහළ මට්ටමකට නැංවිය හැකි ය, යන සංකල්පය අනුව මේ අත්හද බැලීම සිදු කෙරෙයි. රජය මගින් ගොවිජන සේවා කමිටු පිහිටුවීමත්, ගොවි නියෝජිතයන් වශයෙන් විදනේවරුන් යාය මට්ටමින් පත් කිරීමත් නිසා විදනේවරුන් ගේ නායකත්වය යටතේ ගොවි සංවිධාන ඇති කිරීම වඩාත් උචිතයයි තීරණය විණි. එම තීරණවලට බලපෑ හේතු නම්:

1. ගම්බද ගොවියන් විසින් චන්දයෙන් තෝරා ගන්නා ලද නියෝජිතයන් විදනේවරුන් වීම,

2. රට පුරා එවැනි විදනේවරුන් 60,000 කට වැඩි සංඛ්‍යාවක් සිටින හෙයින් ඔවුන් ගේ නායකත්වය යටතේ ඇති කෙරෙන ගොවි සංවිධාන මගින් රටේ කෘෂිකාර්මික සංවර්ධන යෙහි ලා සවිමත් පදනමක් දැමිය හැකි වීම,

3. විදනේවරුන් තෝරා පත් කර ඇත්තේ ගොවි ජන සේවා පනත යටතේ හෙයින් එම පනත යටතේම ඇති කෙරෙන ගොවිජන සේවා කමිටුත්, ගොවීනුත් අතර හොඳම සම්බන්ධී කරණ පුරුක විදනේවරුන් වීම සහ,

4. කෘෂිකාර්මික සංවර්ධනය කෙරෙහි බෙහෙවින් හේතු සාධක වන යෙදවුම් හා අනෙකුත් සේවාවන් ද සැපැයීම ගොවිජන සේවා කමිටු වල වගකීම වන අතර, කුඩා පරිමාණයේ ගොවි සංවිධානත් එම කමිටුත් අතර සම්බන්ධීකරණය විදනේවරුන් ගේ මාර්ගයෙන් ඇති කළ හැකි වීම.

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් දියත් කර ඇති නියමු ව්‍යාපෘතියට අයත් වන ගල්ගමුව ගොවිජන සේවා කමිටු බල ප්‍රදේශය තුළ වගා නිලධාරීන් 12 දෙනෙක් ද, විදනේ වරුන් 61 දෙනෙක් ද, සිටිති.

**සැලසුම් සම්පාදනය**

කෘෂිකාර්මික සංවර්ධනයට අදළ සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය ගොවීන්ගේ අවශ්‍යතා වන්ට අනුව පහළ ම මට්ටමේ සිට පටන් ගැනීම වඩාත් යෝග්‍ය බව පැහැදිලිව පෙනී ගොස් ඇති කරුණකි. එසේම විටින් විට වෙනස් වන තත්ත්වයන්ට ගැලපෙන අයුරින් සැලසුම් සම්පාද නය හා ක්‍රියාත්මක කිරීම ද, නිරන්තරයෙන් ම සමාලෝචනයට හා සුදුසු ආකාරයේ වෙනස් කිරීම් වලටද භාජනය කිරීමට සිදු වෙයි. මේ කාර්යය සඳහා පහළ ම මට්ටමින් කිසියම් ආයතනයක් හෝ සංවිධානයක් හෝ අවශ්‍ය කෙරේ. තෝරා පත් කර ගත් ගොවි නියෝජිතයන් ගේ නායකත්වය යටතේ ගොවීන් කණ්ඩායම් වශයෙන් සංවිධානය වීම ගොවීන් සඳහා මෙකී ස්ථිර ආයතනය බිහි කිරීම පිණිස ගනු ලබන පියවරකි.

ව්‍යාපෘතිය ආරම්භයේ දී ම ගල්ගමුව ගොවි ජන සේවා මධ්‍යස්ථානයේ දි මේ පිළිබඳ රැස්වීම් ගණනාවක් පවත්වන ලදී. ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරී, කෘෂිකර්ම උපදේශක, කෘෂිකර්ම සංවර්ධන අධිකාරියෙහි කළමණාකරු ආදී ප්‍රාදේශීය මට්ටමේ නිලධාරීහු එම රැස්වීම්වලට සහභාගී වූහ, අනතුරුව වගා නිලධාරීන්, විදනේවරුන් වැනි ගම් මට්ටමේ නිලධාරීන් සමඟ ද සාකච්ඡා පවත්වන ලදී. රැස්වීම් හා සාකච්ඡාවල අරමුණ වූයේ ගම් මට්ටමේ සාමූහික සංවිධාන වලින් ලැබෙන වාසිය, සංවිධානාත්මකව ක්‍රියා කිරීමේ අවශ්‍යතාවය, සුළු ගොවීන් සඳහා ස්ථිර සංවිධානයක් ගොඩ නැංවීමේ වැදගත්කම ආදිය පහද දීම ය. ගොවීන් කණ්ඩායම් වශයෙන් සංවිධානය කිරීම යෝග්‍ය බැව් ගොවි නියෝජිතයෝ මෙන් ම නිලධාරීහු ද පිළිගත්හ.

මුලින්ම බලාපොරොත්තු වූයේ අත්හද බැලීම පිණිස ගොවි සංවිධාන හතරක් පමණක් පිහිටුවීමට ය. එහෙත් ගොවි නියෝජිතයන් මෙන් ම වගා නිලධාරීන් ද විශාල උනන්දුවක් දැක් වූ බැවින් ප්‍රදේශයේ ගොවි නියෝජිතයන් 61 දෙනා අතුරෙන් හතර දෙනකු තෝරා ගැනීම අසීරු කරුණක් විණි. එබැවින් එක් එක් ගොවි නියෝජිතයාට තම තමන් ගේ කොට්ඨාශ වෙනුවෙන් ගොවි සංවිධානයක් බැගින් ඇති කිරීම සඳහා ඉඩ දීමට තීරණය කරන ලදී. ගොවි නියෝජිතයන් 61 දෙනා අතුරෙන් 36 දෙනෙක් 1980 – 81 මාස් කන්නය ආරම්භ වීමට පෙර ගොවි කණ්ඩායම් සංවිධානය කළහ. 1981 මාර්තු අග වන විට ගොවිජන සේවා මධ්‍යස්ථානයෙහි නිල වශයෙන් ලියා පදිංචි කර තිබුණු සමිති ගණන 45 ක් පමණ විය.

කුඩා පරිමාණයේ ගොවීන් ගේ සංවිධානයක (සංගමයක) අරමුණු සහ බලාපොරොත්තු මීළඟට දැක්වේ.

(අ) සමූහ නිෂ්පාදන සැලසුම් සම්පාදනය, වඩා යෝග්‍ය ලෙස යෙදවුම් භාවිතාව, වඩා යෝග්‍ය ලෙස වාරි ක්‍රම පාලනය සහ වඩා යෝග්‍ය අලෙවි විධි විධාන මගින් කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කිරීම.

(ආ) බෝග වගාව සහ සත්ත්ව පාලනය පිළිබඳ වැඩි කළ ක්‍රමෝප ක්‍රම උගෙනීම.

(ඇ) ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය කිරීම සහ සුළු ඉතිරි කිරීම තැන්පතු මගින් මූල ධනය රැස්කිරීම සහ,

(ඈ) සංගමයේ සාමාජිකයන් ගේ අභිවෘද්ධියට හේතු සාධක වන්නා වූ වෙන යම් හෝ ඵලදායී කාර්ය යන් කිරීම.

ක්‍රියාකාරිත්වය

1. සෑම කන්නයක දී සහ සෑම බෝගයක් සඳහාම ඇස්තමේන්තු යෙදවුම් අවශ්‍යතාවන් දක්වමින් නිෂ්පාදන සැලැස්මක් සාමාජිකයන් විසින් සකස් කරනු ඇත.

2. අදාළ නියෝජිත ආයතන සමඟ ඔවුන් ගේ සැපයුම් සඳහා විධි විධාන යොදනවා මෙන්ම අවශ්‍ය කුමන අස්වනක හෝ අලෙවි කටයුතුද බාර ගෙන ඉටු කරනු ඇත.

3. වාරි ජලයෙන් උපරිම ප්‍රයෝජන අත් කර ගැනීම සහතික කරනු සඳහා වාරි පහසුකම් සම්බන්ධ පාලනය සංගමය මගින් බාර ගෙන ඉටු කරනු ඇත.

4. සාමාජිකයින් ගේ කෘෂි නිෂ්පාදන අලෙවි කිරීම සඳහා විධි විධාන යොදනු ඇත.

5. තමන් මුහුණ පාන ප්‍රශ්න සහ ඊට යෝග්‍ය පිළියම්ද පිළිබඳව සාමූහිකව සාකච්ඡා කිරීම සඳහා නියම කර ගත් දින වකවානුවල දී සංගමයේ සාමාජිකයන් විසින් නියත රැස්වීම් වාර පවත්වනු ඇත.

6. සංගමයේ අරමුදල් ආරක්ෂිතව තැන්පත් කිරීම සඳහා සාමාජිකයන් ගේ එකඟතාවය ඇතිව තීරණය කැරුණු බැංකුවක සංගමය මගින් බැංකු ගිණුමක් පවත්වා ගෙන යනු ඇත.



උස්ගල – සියඹලන්ගමුව කුඩා පරිමාණයේ ගොවීන්ගේ සංවිධානයේ රැස්වීමක්.

7. අවශ්‍ය වන අවස්ථාවල දී පරීක්ෂාව යටතේ සංගමය මගින් ණය ක්‍රමයක් ක්‍රියාත්මක කරන අතර, මුල් මුදල හා පොලී ප්‍රමාණයන්ද නියි කලට ආපසු ගෙවීම පිළිබඳව සංගමය වගකීම දරනු ඇත.

8. ඉදිරි කාලයේ දී ලැබිය හැකි දීමනාවන්, ප්‍රදානයන්, ත්‍යාග ආදිය සංගමය මගින් භාර ගනු ඇත.

9. සාමාජිකයන් ගේ අභිවෘද්ධියට හේතු සාධක වන වෙනත් ඕනෑම කටයුත්තක් සංගමය මගින් භාර ගෙන ඉටු කරනු ඇත.

**සාමාජිකත්වය**

ගමෙහි ජීවත් වෙන, වයස අවුරුදු 18 ට නො අඩු යහපත් මානසික තත්ත්වයක පසුවන ඕනෑම වැඩිහිටි පුරුෂයෙක් හෝ කාන්තාවක් හෝ සංග මයේ සාමාජිකත්වය ලැබීමට සුදුසුකම් ලබයි. සැම සාමාජිකයෙකු ම පහත දැක්වෙන මූලික ප්‍රතිපත්ති කෙරෙහි එකඟ විය යුතු ය.

(අ) කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන කණ්ඩායම් නිෂ්පාදන සැලැස්මට අනුකූලතාවය දැක්වීම.

(ආ) වාරි ජලය පාවිච්චිය පිළිබඳව කණ්ඩායමේ තීරණවලට බැඳී කටයුතු කිරීම.

(ඇ) කණ්ඩායම් රැස්වීම් හා සාකච්ඡා වලට පැමිණීම.

(ඈ) ඉතිරි කිරීමට පුරුදු වීම සහ ඉතිරි කිරීමේ තැන්පතු ඇති කිරීම.

(ඉ) වැඩි දෙනා ගේ තීරණ පිළිගැනීම.

(ඊ) සාමාජික මුදල්, ගාස්තු ආදිය ගෙවීම.

(උ) සංගමයේ අතුරු ව්‍යවස්ථාවලට බැඳී කට යුතු කිරීමට එකඟ වීම. සහ,

(ඌ) කණ්ඩායමේ විනය පිළිගැනීම.

**පාලනය**

එදිනෙද කටයුතු සඳහා සංගමයේ පාලනය සාමාජිකයන් අතුරෙන් තෝරා ගන්නා ලද පුද්ගල යන් 6 – 9 අතර පිරිසක ගෙන් සෑදුම් ලත් පාලන කමිටුවකට භාර කරනු ලැබේ. පාලන කමිටුවට පහත සඳහන් නිලධාරීහු ඇතුළත් වෙති.

සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම් භාණ්ඩාගාරික, සහකාර භාණ්ඩාගාරික, විධායක සාමාජිකයන් තිදෙනෙක්.

සාමාජිකයන් විසින් දැනටමත් තෝරා ගන්නා ලදුව රජය මගින් ද පිළිගනු ලැබ සිටින හෙයින් සංගමයේ (නිල බලයෙන්) ලේකම් සහ භාණ්ඩාගාරික ද හැටියට විදනෝ කටයුතු කරනු ඇත.

සංගමයේ සමස්ත පාලනය පිළිබඳ වගකීම පාලන කමිටුව වෙත පැවරෙන අතර, එම කමිටුව සාමාජිකයන්ට මෙන් ම බාහිර නියෝජිත ආයතන වලට ද වගකිය යුතු ය.

**ප්‍රතිඵල බිඳක්**

සාමූහිකව සංවිධානය වී ගොවිතැන් කිරීමේ ක්‍රමය හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් වශයෙන් වගා උනන්දුව වැඩි වී ඇති සැටි ගල්ගමුව ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් බීජ වී හා අතිරේක බෝග බීජ ගොවි මහතුන් වෙත නිකුත් කිරීම පිළිබඳ සටහනකින් පැහැදිලි වෙයි. සටහන අනුව 1979 – 80 මාස් කන්නයේ දී බිත්තර වී නිකුත් කර තිබුණේ බුසල් 720 ක් පමණි. මුං, කව්පි, සෝයා බෝංචි, රට කජු, බඩ ඉරිඟු, සෝගම් ආදී අතිරේක බෝග බීජ කිලෝ ග්‍රෑම් 309 කි. මිරිස් ඇට කිලෝ ග්‍රෑම් බාගයේ පැකට් 30 කි. එහෙත්, ගොවි සංවිධාන ක්‍රමය හඳුන්වා දුන් පසුව ලැබූ 1980/81 මාස් කන්නයේ දී බිත්තර වී නිකුත් කිරීම බුසල් 2,710 දක්වා ඉහළ ගොස් තිබුණු අතර, එය බුසල් 2,000 කින් පමණ වැඩි වීමකි. 1981 ජනවාරි මස තුන් වැනි සතිය අවසන් වන විට මුං, කව්පි ආදී අතිරේක බෝග බීජ කිලෝ ග්‍රෑම් 1,186 ක් ද, කිලෝ ග්‍රෑම් බාගයේ මිරිස් ඇට පැකට් 114 ක් ද නිකුත් කර තිබිණි. වැව්වල ජලය අපතේ නොයවා රැස්කර තබා ගැනීමට හැකි වීමෙන් උස්ගල – සියඹලන්ගමුව වැව යටතේ පමණක් 1981 යල කන්නයේ දී අක්කර 3,000 ක් වගා කිරීමට හැකිවී ඇත. යල වගා කිරීමට හැකි වීම යනු පිට පිටම කන්න තුනක් එකදිගට වගා කිරීමට හැකිවීමය. (1979– 80 මහ, 1981 යල සහ 1981 – 82 මහ) අතරගල්ල – පාලුකඩවල ගොවීන්ගේ අස්වැන්න අක්කරයකට බුසල් 100–120 දක්වා වැඩිවී තිබීමද හොඳ නිදසුනකි.

(තවත් කොටසක් ජූනි කලාපයේ)